# මිනිසා හා තොරතුරු

## පාඩම් අංක 15.

01. හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

1. යමක් මැනවින් ප්‍රකාශ කිරීම සන්නිවේදනය නම් වේ. (...........)

2. මුද්‍රිත මාධ්‍යයක් නොවන්නේ අත්පත්‍රිකා ය. (...........)

3. පරිගණක යොදාගෙන සුබපැතුම්පත්, අත්පත්‍රිකා රූප නිර්මාණය කළ හැකිය. (...........)

4. ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයකි. (...........)

5. රූපවාහිනිය නැරඹීමෙන් බෙල්ලේ ආබාධ ඇති වේ. (...........)

6. විද්‍යුත් සන්නිවේදනයේ දී විද්‍යුත් තැපැල පෙරළිකාර මෙවලමකි. (...........)

7. පුස්තකාලයට ගියවිට නිශ්ශබ්දව හැසිරිය යුතු නොවේ. (...........)

8. විදුහල්පතිතුමාට පාසල් වේලාව තුළ ගුරුවරුන් හා දරුවන් එකවර නිවේදනය කළ හැකි ක්‍රමය, ශබ්ද විකාශන යන්ත්‍රය යි. (...........)

9. රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ අංකය (දුරකථන) 1919 වේ. (...........)

10. අතීතයේ මිනිසුන් සන්නිවේදනය සඳහා ජංගම දුරකථනය භාවිතා කර ඇත. (...........)

02. පහත පහසුකම් සලසා ගැනීමට යොමු විය යුතු දුරකථන අංක සොයා යා කරන්න.

| | |
|---|---|
| අධිවේගී මාර්ගයේ තොරතුරු දැන ගැනීම. | 1990 |
| රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය | 1969 |
| සුව සැරිය ගිලන් රථ සේවය | 1929 |
| ළමා හා උපකාරක සේවා | 1919 |
| විදුලිය බිඳ වැටීම් | 1987 |

03. පිළිතුරු සපයන්න.


1. අතීතයේ තොරතුරු සන්නිවේදනය කළ ක්‍රම 3ක් ලියන්න.

2. තොරතුරු ලබාගත හැකි මුද්‍රිත මාධ්‍ය 3ක් ලියන්න.

3. තොරතුරු ලබාගත හැකි විද්‍යුත් මාධ්‍ය 3ක් ලියන්න.

4. විද්‍යුත් තැපැල මඟින් ලබාගත හැකි සේවා 3ක් ලියන්න.

5. ලොව පුරා පොදුවේ භාවිතා කරන පහත සංකේත නම් කරන්න.



04. පාසලේ / නිවසේ අනාරක්ෂිත ස්ථාන හඳුනා ගන්න.

එහි ආරක්ෂාවට ගතයුතු පියවර විස්තර කරන පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

05. නාද මඟින් විවිධ දේ සංකේතවත් කරයි. ඒවා ලියන්න.

උදා :- 1. තැපැල් බෙදාහරින මහතාගේ පැමිණීම - බයිසිකල් සීනු නාදය.

2. අසාධ්‍ය රෝගියෙකු ගෙන යාම -

3. වත්තේ වැඩ ආරම්භය හා නිමාව -

4. පෙරහැරක් එන බව -

5. පාසලේ ආරම්භය දැන්වීමට -

06. පහත වගුව පුරවන්න.

| උපකරණය | වාසි | අවාසි |
|---|---|---|
| ගුවන් විදුලියට සවන් දීමෙන්. | 1.<br>2. | 1.<br>2. |
| රූපවාහිනිය නැරඹීමෙන් | 1.<br>2. | 1.<br>2. |
| පුවත්පත් | 1.<br>2. | 1.<br>2. |

සැකසුම :- ඩබ්.ඩී.එන්. වික්‍රමනායක.

කෑ/මාව/ කෙහෙල්පන්නල ක.වි.

මාවනැල්ල අධ්‍යාපන කලාපය